**ශීර්ෂය 019 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 019 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|
| දේපල පිරියත හා උපකරණ | 1.6.2(ඈ) |
| ජංගම වගකීම් | 1.6.2(ඊ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2023 නොවැම්බර් 30 දිනැති අංක 05 /2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ගෝපදේශයේ 7.9 ඡේදය ප්‍රකාරව, වාර්තාකරණ ආයතනයේ අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින්, තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් "භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්" අගය ගණනය කළ යුතු විය. ඒ අනුව භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් ශේෂය රු. 7,423,754 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.13,429,581 ක් ලෙස රු.6,005,827ක් වැඩියෙන් දක්වා තිබුණි. කල්බදු ණයහිමි ශේෂය වූ රු.6,005,827 ක ඉහත අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | මෙම රු.6,005,827 ක වටිනාකම වන්නේ ආයතනය ලීසිං පදනම මත ලබාගන්නා ලද වාහනවල කල්බදු ආයෝජන වටිනාකමයි. භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් අගය ගණනයේදී එයද ඇතුලත් කර ඇත. 2024 වර්ෂයේදී ලීසිං වාරික ගෙවා අවසන් වන අතර එහිදී එම වටිනාකම් ආයතනයේ දේපළ පිරියත උපකරණ අගයට ඇතුලත් වන බැවින් විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති පරිදි අගය 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ලබා ගත හැකිය. | මාර්ගෝපදේශයේ පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කළ යුතුය. |
| (ආ) | මාර්ගෝපදේශයේ 7.7 ඡේදය අනුව මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතු වුවත්, අත්තිකාරම් ගෙවීම් සටහන් කිරීමේදී හරස් සටහන් සැලකිල්ලට ගෙන නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී හරස් සටහන් මඟින් ලද ලැබීම් වටිනාකම්ද ඇතුලත් වන, ශේෂ පිරික්සුම අනුව වටිනාකම ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් විපක්ෂ නායක කාර්යාලය විසින් එකතු කර තිබූ රු.2,262,927 ක් වූ ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරිමේදී වර්ෂය සඳහා ආදායම් ලැබීම් ලෙස මුදලින් ලද වටිනාකම පමණක් ඇතුලත් කර සකස් කරන ලදී. ඉදිරි ගිණුම් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරිමේදී හරස් සටහන් මඟින් ලද ලැබීම් වටිනාකම්ද ඇතුලත් වන ශේෂ පිරික්සුම අනුව වටිනාකම ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආයතනයේ ශේෂ පිරික්සුම අනුව පිළියෙල කළ යුතුය. |

### (ආ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ආකෘති SA-11 අනුව වෙනත් වැය ශීර්ෂ විසින් විපක්ෂ නායක කාර්යාලය වෙනුවෙන් දරන ලද රු.139,250 ක් වූ වියදම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ පමණක් සටහන් කළ යුතු වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේද දක්වා තිබුණි. | වෙනත් වැය ශීර්ෂ විසින් විපක්ෂ නායක කාර්යාලය වෙනුවෙන් කරන ලද වියදම් මාසික ගිණුම් සාරාංශ මඟින් මෙම කාර්යාලයේ වැය විෂයන්ගෙන් අඩුකරන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආයතනයේ ශේෂ පිරික්සුම අනුව පිළියෙල කළ යුතුය. |

### (ඇ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ විගණිත මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ රු.14,244,186 ක භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් ශේෂය සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ | නිරීක්ෂණය පිළිගනිමි. | අදාල තොරතුරු නිවැරදිව ඇතුලත් කළ යුතුය. |

ප්‍රකාශනයේ ඉකුත් වර්ෂයට අදාල තීරුවේ සටහන් කර නොතිබුණි.

**(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරික්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර ආකෘති SA -52 අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු.2,866,959 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.2,705,081 ක් ලෙස රු.161,878 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA-52) හි 8493-0-0-019-0-11-0 හි ලැබීම් රු.2,705,081 වටිනාකම ඇතුලත් කර ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය භාණ්ඩාගාර මුද්‍රිත ඇසුරින් පිළියෙල කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් අය කර ගැනීම් රු.2,705,081 ක් සහ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් අත්තිකාරම් බී ගිණුමට කරන ලද බැර කිරීම් රු.822,432 ක් ලෙස අත්තිකාරම් අයකර ගැනීම්වල එකතුව රු.3,527,513 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී වර්ෂය සඳහා අත්තිකාරම් ලැබීම් ලෙස මුදලින් ලද වටිනාකම පමණක් ඇතුලත් කර සකස් කරන ලදි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගත යුතුය. |
| (iii) | භාණ්ඩාගාර ආකෘති SA-52 අනුව අත්තිකාරම් ගෙවීම් රු.3,233,249 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.2,410,817 ක් ලෙස රු. 822,432 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA-52) හි 8493-0-0-019-0-11-0 හි ගෙවීම් රු.2,410,817 හි වටිනාකම ඇතුලත් කර ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය භාණ්ඩාගාර මුද්‍රිත ඇසුරින් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iv) භාණ්ඩාගාර ආකෘති SA-51 අනුව අනෙකුත් ආයතන විසින් විපක්ෂ නායක කාර්යාලයේ අත්තිකාරම් "බී" ගිණුමට රු.161,878 ක් බැර කර තිබුණද, අග්‍රිම ගැලපුම් ගිණුමේ (ඒසීඒ - 7 ආකෘතිය) එය රු.822,432 ක් ලෙස රු.660,554 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | නිවැරදි ශේෂයන් ඇතුලත් කළ යුතුය. |

**(ඉ) මූල්‍ය වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට මුදල් පොතේ ශේෂයක් නොතිබූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.4,420,760 ක සෘණ ශේෂයක් දක්වා තිබුණි. | රු.4,420,760 ක් ලෙස දක්වා ඇත්තේ 2023 වර්ෂය තුල ආයතනයේ මුදල්වල ශුද්ධ වෙනස්වීම් වන අතර, 2023.12.31 දිනට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමෙන් අනතුරුව ශේෂයක් නොමැති බවට දක්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදි ශේෂයන් ඇතුලත් කරමින් පිළියෙල කළ යුතුය. |

**(ඊ) ජංගම වගකීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉකුත් වර්ෂයට අදාල අගයන්වල රු.16,866,212 ක් වූ කල්බදු ණයහිමි ශේෂය ඇතුලත් කර නොතිබුණි. එසේම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉකුත් වර්ෂයේ ශේෂයන් නිවැරදිව තුලනය කරද නොතිබුණි. | රු.16,866,212 ක ඉකුත් වර්ෂයට අදාල අගයන් වල සටහන් කර ඇත. තවද කල්බදු වටිනාකම් නිවැරදිව තුලනය කර ලද පසු අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

#### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ට අනුව හැකිතාත් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර නොතිබීම හේතුවෙන් වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කරන ලද එකතුව රු.74,500,000 ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අමතරව පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් එකතුව රු.13,555,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණු ද සමාලෝචිත වර්ෂය අවසානයේ දී ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.3,861,062 ක ඉතිරිවීම් පැවතුණි. | 2023 වර්ෂයට අදාල මුල් ඇස්තමේන්තුව තුල නියෝජ්‍ය සංවිධායකවරුන් දෙදෙනෙකු සහ එම කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැරීමට සිදුවන පුද්ගල පඩිනඩි, දීමනා, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් පහසුකම් සැපයීම වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් ඇතුලත් නොවන බැවින්, එම වියදම් දැරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන වෙන් කර ගන්නා ලදී.<br>ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2023 අනුව වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් ඉතිරි කිරීම් කළ යුතු බැවින් ඉතිරිවීම් සිදු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) | මූලික ඇස්තමේන්තු සකස් කිරීමේ දී අධි ප්‍රතිපාදන සලසා ගැනීම නිසා වැය විෂයයන් දෙකක එකතුව රු.18,000,000 ක ඇස්තමේන් ප්‍රතිපාදනයෙන් එකතුව රු.4,382,000 ක් මු.රෙ 66/69 මඟින් වෙනත් වැය විෂයයන්වලට මාරු කිරීමෙන් පසු තවදුරටත් එකතුව රු.2,503,124 ක් ඉතිරිවී තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2023 අනුව වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් ඉතිරි කිරීම් කළ යුතු බැවින් ඉතිරිවීම් සිදු කර ඇත. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වියදම් නිවැරදිව පුරෝකථනය කර නොමැතිවීම හේතුවෙන් විදේශීය ගමන් වියදම් සඳහා රු.1,000,000 ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.502,943 ක් වූ සියයට 50 ක් ඉතිරි වී තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2023 අනුව වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් ඉතිරි කිරීම් කළ යුතු බැවින් ඉතිරිවීම් සිදු කර ඇත. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 2(අ) ඡේදය ප්‍රකාරව පුනරාවර්තන ප්‍රතිපාදයෙන් සියයට 06 කට සමාන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරිය යුතු වුවත්, කාර්යාලයේ පුනරාවර්තන වියදම් සඳහා වු ප්‍රතිපාදනයෙන් සියයට 04 ක ප්‍රමාණයක් පමණක් ඉතිරි කර තිබුණි. | නව නියෝජ්‍ය සංවිධායක වරුන් පත් කිරීම නිසා, එම සංවිධායකවරුන් සඳහා සහ එම කාර්ය මණ්ඩල වලට අවශ්‍ය පහසුකම් සැපයීමට සිදු වූ බැවින් 6%ක ප්‍රතිපාදනයක් ඉතිරි කිරීමට නොහැකි වූ බවත්, 2% ක ප්‍රතිපාදනයක් පමණක් ඉතිරි කළ හැකි බවත් භාණ්ඩාගාරය දැනුවත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.799,196 ක බැරකම්, බැරකම් හා බැදීම් ප්‍රකාශයේ (භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ) හා බැරකම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණු අතර වැය විෂයයන් දෙකක එකතුව රු.167,585 ක්වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂය සඳහා ගිණුම් සකස් කිරීමේදී බැරකම් වටිනාකම් ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | වර්ෂයට අදාල සියලුම බැරකම් මුල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතු අතර ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම නොකළ යුතුය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කාර්යාලයේ කාර්යයන්ට අදාළව වියදම් දැරීම සඳහා බලය පැවරීම මුදල් රෙගුලාසි අනුව සිදු කර විගණකාධිපති වෙත දන්වා ඇති අතර, වියදම් දැරීමේ ක්‍රියාවලිය පිළිබඳව හා අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාලෝචනයන් සිදුකර කලින් කලට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි අත්‍යවශ්‍ය වෙනස්වීම් සිදුකර ඇතත්, එම තොරතුරු ලිඛිතව විගණනයට දන්වා නොමැත. | ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (i) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ iv වන උප වගන්තිය | 3,005,046 | නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව වේලාව පදනම් කර ගනිමින් ගෙවනු ලබන අතිකාල හා දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කර ගත යුතු වුවද, 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අතිකාල හා දීමනා එසේ සනාථ කර ගැනීමෙන් තොරව ගෙවා තිබුණි. | මේ වන විට ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර සවිකිරීමට කටයුතු කර ඇති අතර, නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා මෙම වාර්තා උපයෝගී කර ගනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ජේදය ප්‍රකාරව සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් තම | ඉදිරි ගිණුම් වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ඇතුලත් | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනයට පැවරී ඇති විෂයයන් සහ කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු වුවද, විපක්ෂ නායක කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රාග්ධන වැඩසටහන් පමණක් ඇතුළත් කර තිබුණි. තවද, මාර්ගෝපදේශ අංක 13 හි 4 ඡේදයට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මද ඉදිරිපත් කර නොතිබුණි. | කිරීමට හා සවිස්තරාමක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට සටහන් කර ගන්නා ලදි. | |
| (ආ) | විපක්ෂ නායක කාර්යාලයේ අංක 30 කාර්යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් හා පුනරුත්ථාපන කාර්යයන් සඳහා රු. 500,000 ක් වෙන් කර තිබුණද, එහි ආරක්ෂිත මුර කුටිය සැකසීම හා සවිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.1,477,000 ක් වූ බැවින් ප්‍රසම්පාදන සැලැස්මේ අගය හා සත්‍ය කොන්ත්‍රාත් වටිනාකම අතර සියයට 195 ක විචලනයක් විය. | 2023 වර්ෂයේ අයවැයගත ඇස්තමේන්තුව හා ප්‍රසම්පාදන සැලස්මට අනුව රු. 500,000 බැගින් අංක 30 කාර්යාලය සඳහාද රු.500,000 ක් පාර්ලිමේන්තුවේ පිහිටි කාර්යාලය සඳහා වෙන් කර තිබුණු නමුත්, අංක 30 කාර්යාලයේ ආරක්ෂිත මුර කුටිය සැලසීම අත්‍යවශ්‍ය හා වැදගත් කාරණයක් ලෙස ඉස්මතු වූ හෙයින් සියලු ප්‍රතිපාදන උපයෝගී කරගෙන මෙම කාර්යය සිදු කිරීමට සිදු විය. | ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ඉහත (ආ) හි කාර්යය සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින ආරම්භ කර සැප්තැම්බර් 30 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, ස්ථානීය පරීක්ෂාවක් සිදුකර නවීකරණ කාර්යයන්හි අවශ්‍යතාවය හඳුනා ගැනීම 2023 අගෝස්තු මස සිදු කර තිබීමෙන් සැලසුම් සකස් කිරීමේ ඵලදායීතාවය අවම මට්ටමක පැවතුණි. | මෙම කාර්යය ජනවාරි 01 දින ආරම්භ කිරීමට සැලසුම් කරනු ලැබුවද ගරු විපක්ෂ නායකතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලය නිරන්තරයෙන් මෙම කාර්යාලයේ රැඳී සිටින බැවින් පිටත නිලධාරීන් ගෙන්වාගෙන මෙම කාර්යය සැලසුම් කිරීමට අනපේක්ෂිත කාල පමාවක් සිදු වී ඇත. මෙකී ප්‍රසම්පාදනය සඳහා කාල ප්‍රමාදයක් සිදු වූවද ගරු විපක්ෂ නායකතුමාගේ | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

දෛනික කාර්යයන් කල් නොදැමිය හැකි තත්ත්වයක් මත කාල පමාවක් සිදු විය.

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉතා කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා අදාල කාල පරිච්ඡේදය තුළ ඉදිරිපත් කළ යුතුය. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මේ වන විට අභ්‍යන්තර විගණන කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කර ඇති අතර විගණන කළමනාකරණ කමිටු රැස්වීමක්ද පැවැත්වීමට කටයුතු යොදා ඇත. | ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 50 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 43 ක් වූයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 07 ක් විය. ඒ තුල ජ්‍යෝෂ්ඨ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙක් විය. | සුදුසු නිලධාරීන් තෝරා කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |